ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>නවෙන පළාත් පාලන නියෝජිත කණ්ඩායම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන</u>**

ශ්‍රී ලංකාවේ විවිධ දේශපාලන පක්ෂ 10කට අයත් පළාත් පාලන නියෝජිතයන් 28 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් හයිඩ්‍රාබාද් හි ග්‍රාමීය සංවර්ධන සහ පංචායත් රාජ් ජාතික ආයතනයේ දින 10ක් පුරා පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වූහ.

2. ශ්‍රී ලංකාවේ පළාත් පාලන නියෝජිතයන්ගේ දැනුම සහ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා නිර්මාණය කරන ලද පුළුල් පරාසයක විවිධ මාතෘකා මෙම වැඩසටහන මගින් ආවරණය කරන ලදී. තිරසාර සංවර්ධන අභිමතාර්ථ රටට අදාළ අයුරින් සකස් කර ගැනීම සහ ඉන්දියාවේ මුලපිරීම් සහ මනා පිළිවෙත් ආදර්ශයට ගෙන විමධ්‍යගත සැලසුම් හරහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීමට පවතින හැකියාව සම්බන්ධයෙන් ප්‍රධාන සැසිවලදී අවධානය යොමු කරන ලදී. ග්‍රාම පංචායත් හරහා ස්වයං මූලාශ්‍ර ආදායම් උත්පාදනය ඉහළ නැංවිය හැකි උපායමාර්ග, ආර්ථික සමීක්ෂණ සඳහා සරල ක්‍රමවේද සහ තෙලංගනා ප්‍රාන්තයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාව සහ ප්‍රාථමික අධ්‍යාපනයේ ක්‍රියාකාරිත්වය වැනි කරුණු සම්බන්ධයෙන් ද සහභාගීවන්නන් විසින් අධ්‍යයනය කරන ලදී.

3. පන්ති කාමර සැසිවලට අමතරව ශ්‍රී ලංකා කණ්ඩායම පළතුරු සහ උද්භිද විද්‍යා පර්යේෂණ ආයතන, අන්ගන්වඩි මධ්‍යස්ථාන, සමූපකාර බැංකු, කාන්තාවන් විසින් මූලිකත්වය ගනු ලබන කිරි ආශ්‍රිත කර්මාන්ත, තෙලංගනාවේ පිහිටා ඇති ස්ත්‍රී නිධි සහ ග්‍රාමීය දරිද්‍රතාවය පිටදැකීම සඳහා වන සමිති කාර්යාලයේ නිරීක්ෂණ චාරිකාවල ද නිරත වූහ.

4. මෙම පිරිස තමිල්නාඩුවේ නිල්ගිරිස් වෙත ද ගොස් වතු කම්කරුවන් සඳහා වන සුබසාධන ක්‍රියාමාර්ග සහ පහසුකම් පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර ප්‍රාථමික සෞඛ්‍ය සහ අධ්‍යාපන ආයතන වෙත ද ගියහ. ඔවුහු කාන්තාවන් විසින් මූලිකත්වය ගන්නා ග්‍රාමීය ජීවනෝපාය මුලපිරීම් සම්බන්ධයෙන් ද ගවේෂණය කළහ. අධ්‍යයන

චාරිකාව අතරතුරදී ඔවුහු නිල්ගිරිස් හි දිස්ත්‍රික් ප්‍රධාන පරිපාලන නිලධාරීතුමා ද හමු විය. තේ වතු සහ ප්‍රදේශයේ වෙනත් ආර්ථික කර්මාන්ත ද දැක බලා ගත් ශ්‍රී ලංකා කණ්ඩායම ඒ තුළින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සහ විමධ්‍යගත දේශීය පාලනය සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා ගත්හ.

5. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 අප්‍රේල් සංචාරය අතරතුර දී ශ්‍රී ලාංකික වෘත්තිකයන් 700 දෙනෙකු සඳහා විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර මෙම වැඩසටහන එම වැඩි දියුණු කරන ලද ධාරිතා සංවර්ධන රාමුව යටතේ සංවිධාන කරන ලදී.

***

කොළඹ
*2026 ජූලි 31*